# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2150/5 - 2019 නොවැම්බර් මස 19 වැනි අඟහරුවාදා - 2019.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

*මගේ අංකය* : IR/Com/04/2017/44

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.05.16 දිනැති හා අංක 2071/53 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.04.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන්,

01. ටී. ඩී. තිස්ස ගුණසේන මයා,
අංක 121/ජී/5, ස්වර්ණ ජයන්ති මාවත,
අස්ගිරිවල්පොල, උඩුගම්පොල.

02. එච්. කේ.  එම්. ටී. කේ. ධර්මදාස මයා,
අංක 121/ජී/1, ස්වර්ණ ජයන්ති මාවත,
අස්ගිරිවල්පොල, උඩුගම්පොල

03. කේ. ප්‍රේමසිරි මයා,
අංක 39/73, නෙල්සන් පටුමඟ, කොළඹ 03.

04. එම්. බී. කේ. රන්දෙනිය මයා,
අංක 256/2, තිස්සදෙණිය, ඇඹිල්මීගම,
පිළිමතලාව.

05. ආර්. එල්. පී. බී. විජයනාම මයා,
අංක 38/2/බී, නාරංවල, ගම්පහ

06. එච්. වී. හේමලතා මිය,
අංක 1116/ඕ6, 9 වන පටුමඟ,
වික්‍රමසිංහ පුර, බත්තරමුල්ල.

07. එම්. කේ. ජී. වසන්ත කුමාර මයා,
අංක 171/1, පාදිලියාතුඩුව පාර,
හුනුපිටිය, වත්තල.

08. ටී. ජී. පී. පීරිස් මයා,
අංක 441, ගාලුපාර,
නල්ලූරුව, පානදුර

09. ජේ. ඩබ්. පුෂ්පකුමාර මයා,
''ශෂික'', නෙල්ලිගොඩ,
කරගොඩ,  උයන්ගොඩ.

10. එල්. ඩබ්. අතුකෝරල මයා,
අංක 63/බී, කොතලාවල,
විහාර මාවත, කඩුවෙල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

උපාලි නිව්ස් පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 223, බ්ලූමැන්ඩල් පාර,
කොළඹ 13.

අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.10.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.


1 A – G 31492— 24 (2019/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කාර්මික අධිකරණයේ දී ය

01. ටී. ඩී. තිස්ස ගුණසේන මයා,
අංක 121/ජී/5, ස්වර්ණ ජයන්ති මාවත,
අස්ගිරිවල්පොල, උඩුගම්පොල.

02. එච්. කේ. එම්. ටී. කේ. ධර්මදාස මයා,
අංක 121/ජී/1, ස්වර්ණ ජයන්ති මාවත,
අස්ගිරිවල්පොල, උඩුගම්පොල

03. කේ. ප්‍රේමසිරි මයා,
අංක 39/73, නෙල්සන් පටුමඟ, කොළඹ 03.

04. එම්. බී. කේ. රන්දෙනිය මයා,
අංක 256/2, තිස්සදෙණිය, ඇඹිල්මීගම,
පිළිමතලාව.

නඩු අංකය :
ඒ/33/2018

05. ආර්. එල්. පී. බී. විජයනාම මයා,
අංක 38/2/බී, නාරංවල, ගම්පහ

06. එච්. වී. හේමලතා මිය,
අංක 1116/ඕ6, 9 වන පටුමඟ,
වික්‍රමසිංහ පුර, බත්තරමුල්ල.

07. එම්. කේ. ජී. වසන්ත කුමාර මයා,
අංක 171/1, පාදිලියාතුඩුව පාර,
හුනුපිටිය, වත්තල.

08. ටී. ජී. පී. පීරිස් මයා,
අංක 441, ගාලුපාර,
නල්ලූරුව, පානදුර

09. ජේ. ඩබ්. පුෂ්පකුමාර මයා,
''ශෂික'', නෙල්ලිගොඩ,
කරගාඩ, උයන්ගොඩ.

10. එල්. ඩබ්. අතුකෝරල මයා,
අංක 63/බී, කොතලාවල,
විහාර මාවත, කඩුවෙල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

උපාලි නිව්ස් පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 223, බ්ලූමැන්ඩල් පාර,
කොළඹ 13.

ප්‍රදානයයි

1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වග වගන්තියෙන් කම්කරු ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත නම් සඳහන් පාර්ශවකරුවන් අතර වූ කාර්මික ආරවුල් බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2018.04.24 වැනි දින මා වෙත යොමු කරන ලදී.

කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අංක IR (Com/04/2017/44 හා 2018.04.20 දින දරන ලේඛනය අනුව ඉහත නම් සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

''උපාලි නිව්ස් පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ වර්ෂ 10කට වැඩි සේවා කාලයක් සහතිව විශ්‍රාම යන සේවකයින්ට වර්ෂයකට මසක වැටුප පදනම් කර පාරිතෝෂිත ගෙවීමේ ක්‍රමය වෙනස් කර වර්ෂයකට මාස භාගයක වැටුප පදනම් කර පාරිතෝෂික ගෙවීම් නිසා පහත නම් සඳහන් සේවකයින් 10 දෙනාට යම් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

01. ටී. ඩී. තිස්ස ගුණසේන මයා,
02. එම්. කේ. එම්. ටී. කේ. ධර්මදස මයා,
03. කේ. ප්‍රේමසිරි මයා,
04. එම්. බී. කේ. රන්දෙනිය මයා,
05. ආර්. එල්. පී. බී. විජයනාම මයා,
06. එච්. වී. හේමලතා මිය,
07. එම්. කේ. ජී. වසන්ත කුමාර මයා,
08. ටී. ජී. පී. පීරිස් මයා,
09. ජේ. ඩබ්. පුෂ්පකුමාර මයා,
10. එල්. ඩබ්. අතුකෝරල මයා,

ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කර ඇති විස්තර ප්‍රකාශවල සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරුවන් අතරින් සමහරෙක් උපාලි නිව්ස් පේපර්ස් සමාගමේ වසර 25කට අධික කාලයක්ද, තවත් සමහරෙක් වසර 30කට අධික කාලයක් සේවය කර වයස 55 සම්පූර්ණ වූ පසු විශ්‍රාම ගන්වන ලද අය බවත්, ඔවුන්ගේ පාරිතෝෂිතය ලබාදීමේදි සේව්‍ය පාර්ශවය ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය කර ඇති බවත් ය. වසර 10කට අධික කාලයක් සේවය කර ඇති සේවකයින් බවත් ඔවුනට මාස 1/2ක වැටුප සේවය කල වසර ගණනින් වැඩිකර ලබන මුදල පාරිතෝෂික වශයෙන් ලබාදීමෙන් ඔවුනට අසාධාරණයක් සිදුවී ඇති බවත් එහි සඳහන් කර ඇත. ඉල්ලුම්කරුවන් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 10(1) වගන්තියේ සඳහන් සහන ඔවුනට ලැබිය යුතු බවය. සේව්‍ය පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති විස්තර ප්‍රකාශවල සඳහන් කර ඇත්තේ එම සේවකයින්ගේ පාරිතෝෂිකය, පාරිතෝෂික ගෙවීමේ පනතේ ප්‍රකාරව නිසි ආකාරයට ගෙවා ඇති බවත්, එම නිසා ඔවුන්ගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලෙසත් ය.

දෙපාර්ශවය විසින් විස්තර ප්‍රකාශ ගොනු කිරීමෙන් පසු මෙම කාරණය බේරුම් කිරීමෙන් නිරවුල් කිරීමට ඇති හැකියාව විමසා බැලුව ද එසේ නිරවුල් කිරීමට හැකියාවක් නොමැති බව පෙනී ගියෙන් සාක්ෂි විමසීමට තීරණය කලෙමි. ඒ අනුව මෙම නඩුව විභාගය සඳහා කැඳවූ අවස්ථාවේ ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් නීතිඥ සාලිය එදිරිසිංහ මහතා ද, සේව්‍ය පාර්ශවය වෙනුවෙන් නීතිඥ කවීෂා ජයසිංහ මහත්මිය ද පෙනී සිටියහ. ඉල්ලුම්කරුවන් 10 දෙනා වෙනුවෙන් එක් ඉල්ලුම්කරුවෙකු සාක්ෂියට කැඳවීමටත් එම සාක්ෂිය ඉල්ලුම්කරුවන් සියලු දෙනා වෙනුවෙන් යොද ගැනීමටත් ඉල්ලුම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි නිතිඥවරයා කරන ලද ඉල්ලීමට සේව්‍ය පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරිය එකගත්වය පළ කළාය. ඒ අනුව ඉල්ලුම්කරුවෙකු වන එම්. කේ. එම්. ටී. කේ. ධර්මදස යන අය 2018.12.03 වැනි දින සාක්ෂිදීම ආරම්භ කරන ලදී. එම සාක්ෂියේදී ඉල්ලුම්කරුවෙකු වන තිස්ස ගුණසේන යන අයගේ පත්වීමෙ ලිපිය A1 ලෙස ලකුණුකර ඉදිරිපත් කරන ලද අතර සාක්ෂිකරු වන ධර්මදස යන අයගේ පත්වීම් ලිපිය අස්ථාන ගතවී ඇති බව ප්‍රකාශ කරමින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයක් A2 ලෙස ද, ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම ඉල්ලුම්කරුවන් වන කේ. ප්‍රේමසිරි යන අයගේ පත්වීමේ ලිපිය A3 ලෙස ද, එම්. බී. කේ. රන්දෙනිය යන අයගේ පත්වීම් ලිපිය A4 ලෙස ද, ආර්. එල්. පී. බී. විජයනාමගේ පත්වීමේ ලිපිය A5 ලෙස ද, එච්. වී. හේමලතා යන අයගේ පත්විමේ ලිපිය A6 ලෙස ද, එම්. කේ. ජී. වසන්ත කුමාර අය අයගේ පත්වීමේ ලිපිය A7 ලෙස ද, ටී. ජී. පී. පිරිස් යන අයගේ පත්වීමේ ලිපිය A8 ලෙස ද, ජේ. ඩබ්. පුෂ්ප කුමාර යන අයගේ පත්වීමේ ලිපිය A9 ලෙස ද, එල්. ඩබ්. අතුකෝරල යන අයගේ පත්වීමේ ලිපිය A10 ලෙස ද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඊට අනුරූපව එම ඉල්ලුම්කරුවන්ගේ විශ්‍රාම ගැන්වීමේ ලිපි A1(a), A2(a), A3(a), A4(a), A5(a), A6(a), A7(a), A8(a), A9(a), A10(a) ලෙස ලකුණුකර ඉදිරිපත් කරන ලදී.

සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කලේ අවුරුදු 10කට වඩා වැඩි කාලයක් සේවය කල සේවකයින් විශ්‍රාම යනවිට අවසාන මාසික වැටුප සේවය කළ වසර ගණනින් වැඩිකර පාරිතෝෂිතයක් ගෙවීම් ප්‍රතිපත්තියක් සමාගම දිගටම අනුගමනය කළ බවයි. 2016.01.31 වැනි දින විශ්‍රාම ගිය හෙට්ටිකංකානම්ගේ සුරංග ප්‍රදීප් පෙරේරා නමැති සේවකයා විශ්‍රාම ගිය අවස්ථාවේ එවැනි වාසිදයක පාරිතෝෂිකයක් ලැබුණු බව තහවුරු කිරීම සඳහා ඔහුගේ දිවුරුම් ප්‍රකාශයක් A11 ලෙස ද, 2016.01.10 වැනි දින විශ්‍රාමගිය ප්‍රසාද් ශ්‍රීලාල් ප්‍රේමතුංග යන අයගේ දිවුරුම් ප්‍රකාශය A12 ලෙස ද, 2014.10.10 වැනි දින විශ්‍රාමගිය ඩබ්. ඩබ්. ආර්. ගුණරත්න යන අයගේ දිවුරුම් ප්‍රකාශයක් A13 ලෙස ද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම සේවකයින්ට ඔවුන් අවසාන වරට ලැබූ මාසික වැටුප සේවය කළ අවුරුදු ගණනික් වැඩිකර ලැබුණ මුදල පාරිතෝෂිත වශයෙන් ගෙවා ඇති බව සාක්ෂිකරු ප්‍රකාශ කළේ ය.

තවද, එම සාක්ෂිකරු සාක්ෂි දෙන අවස්ථාවේදී උපාලි පුවත්පත් සමාගමේ 2008 වාර්ෂික මුදල් වාර්තාවේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සහතික කරන ලද පිටපතක් A14 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම වාර්තාවේ ද අවුරුදු 10කට වඩා වැඩි කාලයක් සේවය කර ඇති සේවකයින් විශ්‍රාම යන අවස්ථාවේදී අවසන්වරට ලැබූ මාසික වැටුප සේවය කළ වසර ගනනින් වැඩිකර ලැබෙන මුදල පාරිතෝෂිතක ලෙස ගෙවීම් ප්‍රතිපත්තිය සඳහන් වන බව සාක්ෂිකරු ප්‍රකාශ කළේ ය. එම මූල්‍ය වාර්තාවෙ ඊට අදළ කොටස A14(a) ලෙස ලකුණු කරන ලදී. එසේම සාක්ෂිකරු සිය මූලික සාක්ෂියේදී ප්‍රකාශ කලේ 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ අංක 10.1 වගන්තිය අනුව වැඩි වාසිදයක පාරිතෝෂිකයක් ලබා ගැනීමට ඉල්ලම්කරුවන්ට ප්‍රතිපාදන ඇති බවයි. එම පනත A15 ලෙස ද, එම පනතේ 7, 8 පිටු A15(a) ලෙස ද, 10.1 වගන්තිය 15(a)1 ලෙස ද, ලකුණු කරන ලදී. සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කළේ වැඩි වාසිදායක පාරිතෝෂිතයක් ලබා ගැනීමට ඉල්ලුම්කරුවන් හා සමාගම අතර ව්‍යංග ගිවිසුමක් පැවති බවයි.

සමාගම විසින් ඉල්ලුම්කරුවන් විශ්‍රාම ගැන්වීමෙන් පසු ඔවුන්ගේ බැංකු ගිණුම්වලට පාරිතෝෂිත වශයෙන් බැරකර තිබුණේ මාස භාගයක පදනම් කර ගණනය කරන ලද මුදලක් බවත් සාක්ෂිකරු ප්‍රකාශ කළේය. සාක්ෂිකරු සාක්ෂි දෙමින් ඉල්ලුම්කරුවන් 10 දෙනාට සමාගම විසින් ගෙවන ලද පාරිතෝෂිත මුදල ද ඔවුන් ප්‍රකාශ කරන ආකාරයේ වැඩිවාසිදයක පාරිතෝෂිත වශයෙන් ලැබිය යුතු මුදල් ද අඩංගු ලේඛණයක් A16 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරුවන් සියලු දෙනා වෙනුවෙන් සාක්ෂිකරු ඉල්ලා සිටියේ එම ලේඛණයේ සඳහන් හිඟ පාරිතෝෂික මුදල ද, එම මුදලට 12%ක පොළියක් ද, නඩු ගාස්තු වශයෙන් එක් අයෙකුට රුපියල් 50,000/- මුදලක් ද ලබාදෙන ලෙස ය.

2019.03.01 වැනි දින වගඋත්තරකරුවන් වෙනවෙන් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදී. සාක්ෂිකරුගේ පත්වීම් ලිපිය R1 ලෙස ලකුණු කර ඔහුගෙන් විමසා සිටියේ එම පත්වීම් ලිපියේ අඩංගු කොන්දේසිවලට එකග වී පත්වීම් ලබාගෙන තිබෙනවා නේද යන්නයි. ඒ බව සාක්ෂිකරු පිළිගත්තේ ය. එම ලිපියේ අඩංගුව ඇති ''සේවයට බඳවා ගන්නා අවස්ථාවේ පුහුණු දීමනාව වශයෙන් රු. 450 ගෙවන බවත් ඊට අමතරව කිසිදු දීමනාවක් අදල නොවන බවට සඳහන් වී ඇති කොටස R1(a) ලෙස ලකුණු කරන ලදී. එසේම එම ලිපියේ අඩංගු කොන්දේසිය වන ස්ථිර පත්වීමක් ලබාදුන් විට විශ්‍රාම යැමේ අවුරුදු 55 බව සඳහන් කොටස එහි අඩංගුවී ඇති බව සාක්ෂිකරු පිළිගන්නා ලද අතර එම කොටස R1(b) ලෙස ලකුණු කරන ලදී. වැඩිවාසිදයක පාරිතෝෂිකයක් පිළිබඳව එම ලිපියේ සඳහන් වනවාදැයි සාක්ෂිකරුගෙන් විමසූ විට ඔහු දුන් පිළිතුර වූයේ එය ව්‍යංග ගිවිසුමක් බවයි. අවුරුදු 10ක් සේවය කළ අය විශ්‍රාම ගැන්වීමේදී අවසාන මාසික වැටුප සේවය කළ වසර ගණනින් වැඩිකර වැඩිවාසිදයක පාරිතෝෂිකයක් ගෙවීම සමාගම අනුගමනය කළ ප්‍රතිපත්තිය බව හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කලේ ය.

සාක්ෂිකරුගේ මූලික සාක්ෂියේ දී A15 ලෙස ලකුණු කරන ලද 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත හා A15 (ඒ) ලෙස ලකුණු කරන ලද එම පනතේ පාරිතෝෂිකය වාසිදයක ලෙස ආගණනය කල යුතු බවට දක්වෙන 10(1) වගන්තිය පිළිවෙලින් R2 සහ A2(a) ලෙස ලකුණු කරමින් ඒ පිළිබඳව හරස් ප්‍රශ්ණ අසන ලදී. 10(1) වගන්තියේ සඳහන් වැඩිවාසිදයක පාරිතෝෂිතයක් පිළිබඳ සාමූහික ගිවිසුමක් නොමැති බව ද මේ වනවිටත් කාර්මික අධිකරණයකින්, බේරුම්කරණයකින් වැඩිවාසිදයක පාරිතෝෂිකයක් ගෙවිය යුතු බවට නියෝගයක් නැති බවත් වගඋත්තරකාර ආයතනය වැඩිවාසිදයක පාරිතෝෂිකයක් ගෙවන බවට ලිඛිතව කොතනකවත් සඳහන් කර නොමැති බවට යෝජනා කළ විට සාක්ෂිකරුගේ පිළිතුර වූයේ එම වගන්තියේ සඳහන් ''වෙනත් ගිවිසුමක් යනුවෙන් සඳහන් කොටසින් වැඩිවාසිදායක පාරිතෝෂිකයක් තමන්ට හිමි බවය.

ඉල්ලුම්කරුවන් වන තිස්ස ගුණසේනගේ පත්වීම් ලිපිය ආර් 3 ලෙස ද, කේ. ප්‍රේමසිරිගේ පත්වීම් ලිපිය R4 ලෙස ද, එම්. බී. කේ. රන්දෙනිය ගේ පත්වීම් ලිපිය R5 ලෙස ද, ආර්. එල්. පී. බී. විජේනාමගේ පත්වීම් ලිපිය R7 ලෙස ද, එච්. වී. හේමලතාගේ පත්වීම් ලිපිය R8 ලෙස ද, එම්. කේ. ජී. වසන්ත කුමාරගේ පත්වීම් ලිපිය R9 ලෙස ද, ටී. ජී. පී. පීරිස් යන අයගේ පත්වීම් ලිපිය R10 ලෙස ද, ජේ. ඩබ්. පුෂ්ප කුමාර යන අයගේ පත්වීම් ලිපිය R11 ලෙස ද, එල්. ඩබ්. අතුකෝරල යන අයගේ පත්වීම් ලිපිය R12 ලෙස ද, ලකුණු කරමින් සාක්ෂිකරුගෙන් විමසා සිටියේ එම පත්වීම් ලිපිවල වැඩිවාසිදයක පාරිතෝෂිකයක් පිළිබඳව සඳහන් වනවාද යන්නයි. සාක්ෂිකරුගේ පිළිතුරු වූයේ එවැන්නක් එම පත්වීම් ලිපිවල සඳහන්ව නොමැති බවයි.

එසේම සාක්ෂිකරු මූලික සාක්ෂයේ ද A11, A12, A13 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද විශ්‍රාම ගිය සේවකයින් තිදෙනෙකුගේ දිවුරුම් පෙත්සම් පිළිබඳව හරස් ප්‍රශ්න අසමින් සාක්ෂිකරුට යෝජනා කරන ලද්දේ එම දිවුරුම් ප්‍රකාශ ලබා දී ඇති එච්. එස්. පී. පෙරේරා යන සේවකයා විශ්‍රාම ගොස් ඇත්තේ 2016.01.31 වැනි දින බවත්, ශ්‍රීලාල් පේමතුංග නමැති සේවකයාහා විශ්‍රාම ගොස් ඇත්තේ 2016.01.10 වනදා බවත් ආර්. ආර්. ඩබ්. බී. ගුණරත්න නමැති සේවකයා විශ්‍රාම ගොස් ඇත්තේ 2014.10.10 වැනි දින බවටත් යෝජනා කළ විට එම සේවකයින් විශ්‍රාම ගොස් ඇත්තේ එකී දිනවල බව සාක්ෂිකරු පිළිගත්තේ ය. අනතුරුව සාක්ෂිකරුට සමාගමේ ගිණුම් වාර්තා ඉදිරිපත් කරමින් හරස් ප්‍රශ්න අසන ලදී. මූලික සාක්ෂියේ දී A14 ලෙස ලකුණු කරන ලද ගිණුම් වාර්තාව සහ A14(a) ලෙස ලකුණු කරන ලද එම වාර්තාවේ අඩංගු ඡේදය නැවත R13 හා R13(a) ලෙස ලකුණු කරන ලදී. එසේම 2016 වර්ෂයට අදාල ගිණුම් වාර්තාව R14 ලෙසත් එම වාර්තාවේ 2.2 11(a) කොටස R14(a) ලෙසත් 2017 ගිණුම් වාර්තාව R15 ලෙසත් ලකුණු කරන ලදී. සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න ඇසීමෙන් පසු A1, A1(a), A1(a)1, A2, A2(a), A2(a)1, A3, A3(a), A3(a)1, A4, A4(a), A4(a)1, A5, A5(a), A5(a)1, A6, A6(a), A6(a)1, A7, A7(a), A7(a)1, A8, A8(a), A8(a)1, A9, A9(a), A9(a)1, A10, A10(a), A10(a)1, A 11, A12, A13, A14, A14(a), A15, A15(a), A15(a)1, A16 ලේඛන ලකුණු කරමින් ඉල්ලුම්කරුවන්ගේ නඩුව අවසන් කරන ලදී.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද්දේ උපාලි සමූහ ව්‍යාපාරයේ සමූහ මානව සම්පත් කළමනාකරු ය. ඔහුගේ සාක්ෂියේදී පාරිතෝෂිතය ගණනය කිරීම වෙනස් කිරීමේ සම්බන්ධයෙන් 2016.09.06 වැනි දින අධ්‍යක්ෂක මණ්ඩලය ගන්නා ලද තීරණය R16 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම තීරණය ගන්නා ලද්දේ පාරිතෝෂිත ගෙවීමේ පනතේ විධිවිධානවලට අනුව බව සාක්ෂිකරු ප්‍රකාශ කළේ ය. එසේම සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කළේ 2016.01.31 දිනට පෙර රැකියාවෙන් විශ්‍රාම ගන්වනු ලැබූ සේවකයින්ට පාරිතෝෂිත ගෙවන ලද්දේ මාසික වැටුප පදනම් කරගෙන බවය. මෙම නඩුවේ ඉල්ලුම්කරුවන්ට අදළ වන්නේ R16 ලෙස ලකුණු කරන ලද ලේඛනය අනුව මාස භාගයක් පදනම් කරගත් විශ්‍රාම වැටුප බව සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කළේ ය.

සේව්‍ය පාර්ශවය වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද්දේ සමාගමේ මානව සම්පත් කලමනාකරු පමණි. ඔහුගේ සාක්ෂිය අවසන්වීමෙන් පසු R1 සිට R16 දක්වා ලේඛණ ලකුණු කරමින් එම පාර්ශවයේ නඩුව අවසන් කරන ලදී. අනතුරුව දෙපාර්ශ්වය විසින් ලකුණු කරන ලද ලේඛන සමග ලිඛිත දේශන ගොනු කරන ලදී.

නිරාකරණය කිරීමට මා වෙත යොමුකර ඇති කාර්මික ආරවුල වන්නේ වර්ෂ 10කට වැඩි කාලයක් සහිතව විශ්‍රාම යන සේවකයින්ට වර්ෂයකට මසක වැටුප පදනම් කරගෙන පාරිපෝෂිකය ගෙවීමේ ක්‍රමය වෙනස් කර වර්ෂයකට මාස භාගයක වැටුප පදනම් කර පාරිතෝෂිකය ගෙවීම නිසා ආසාධාරනයක් සිදුවි ඇද්ද යන්නයි.

මුලින්ම සමාගම මාසයක වැටුප පදනම් කරගෙන පාරිතෝෂිකය ගෙවීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබේද යන්න පිළිබඳව අවධානය යොමු කළෙමි. දෙවන පාර්ශවය ප්‍රකාශ කර සිටින්නේ මාස භාගයක් පදනම් කරගෙන පාරිතෝෂිත මුදල් ගෙවනු ලබන්නේ 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 6(2)(අ) වගන්තිය අනුව බවයි. එම පනතේ 6(2)(අ) වගන්තිය මෙසේ ය.

''ඒ කම්කරුවා මාසික පඩි ලබන කම්කරුවෙකු වන විටෙක ඒ කම්කරුවා විසින් අන්තීමට ලබා ගන්නා ලද වැටුප හෝ වේතනයේ අනු ප්‍රමාණය අනුව ආගනණය කරනු ලැබූ, සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුපට හෝ වේතනයට සමාන මුදලක් පාරිතෝෂිතය වශයෙන් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය. ''

දෙවන පාර්ශවය නඩු විභාගයේ දී එය R2(b) ලෙස ලකුණු කරන ලදී.

ඉල්ලුම්කාර පාර්ශවයේ ස්ථාවරය වන්නේ පාරිතෝෂික ගෙවීමේ පනතේ 10(1) වගන්තියේ සඳහන් සහන ඉල්ලුම්කරුවන්ට ලැබිය යුතු බවයි. 10(1) වගන්තිය මෙසේ ය.

''කම්කරුවෙකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සාමුහික ගිවිසුමකින් කාර්මික ආරවුල් පනත යටතේ වූ කාර්මික අධිකරණයකින් හෝ බේරුම්කරුවෙකුගේ ප්‍රදානයකින් හෝ වෙනත් යම් ගිවිසුමකින් පාලනය වන අවස්ථාවක ඔවුන්ගේ සේවාවන් සම්බන්ධයෙන් ඒ පාරිතෝෂිකය ආගණනය කිරීම ඒ සාමුහික ගිවිසුමේ කාර්මික අධිකරණයේ හෝ බේරුම්කරුගේ ප්‍රදානයේ හෝ වෙනත් ගිවිසුමේ දක්වා ඇති පාරිතෝෂිකය හෝ ආන්තික ප්‍රතිලාභ මේ පනත යටතේ ගෙවිය යුතු පාරිතෝෂික වඩා කම්කරුවාට වාසිදයක වන්නේ නම් අවස්ථාචෝචිත පරිදි ඒ සාමුහික ගිවිසුමේ කාර්මික අධිකරණයේ හෝ බේරුම්කරුවෙකුගේ ප්‍රදානයේ හෝ වෙනත් ගිවිසුමේ නියමයන්ට අනුකූලව කරනු ලැබිය යුතු ය. ''

ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ප්‍රකාශ කර සිටියේ එම වගන්තියේ සඳහන් වැඩිවාසිදයක පාරිතෝෂිතයක් මෙම ඉල්ලුම්කරුවන්ට හිමිවිය යුතු බවය. එසේම ඉල්ලුම්කරුවන් වෙනුවෙන් වැඩිදුරටත් සඳහන් කරන ලද්දේ මාසයක වැටුප පදනම් කරගත් පාරිතෝෂිතයක් ගෙවීමට ඉල්ලුම්කාර පාර්ශවය හා සේවා පාර්ශවය අතර ''Implied Contact'' එකක් පැවති බවය.

මෙම සේවකයින් 10 දෙනා 2005 වසරට පෙර සේවයට බඳවා ගන්නා ලද අවුරුදු 10කට වඩා වැඩි කාලයක් සමාගමේ සේවය කර විශ්‍රාම ගන්වනු ලැබූ සේවකයින් බව දෙවන පාර්ශවය පිළිගන්නා ලද කරුණකි. එම සේවකයින්ට මාස 1/2ක වැටුප පදනම් කරගෙන පාරිතෝෂික මුදල ගෙවීම පාරිතෝෂික පනතේ 6(2) වගන්තියට අමතරව තවත් කාරණා හේතු වු බව සේවා පාර්ශවයේ අදහස වී ඇත. ඉන් එක් කරුණක් වන්නේ ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් ලිපිවල වැඩිවාසිදයක පාරිතෝෂිකයක් ගෙවීම පිළිබඳ කොන්දේසියක් අඩංගුව නොතිබීම යන්නයි. ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් ලිපි R වශයෙන් ලකුණු කර ඒ පිළිබඳ ඉල්ලුම්කරු වෙනුවෙන් සාක්ෂි දුන් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී. පාරිතෝෂික ගෙවීමේ පනත සම්මත කර ඇත්තේ 1983 වසරේ දී ය. ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් ලිපි පරීක්ෂා කිරීමේදි පැහැදිලි වන්නේ ඔවුන්ගේ සමහරෙකු සමාගමේ සේවයට බඳවාගෙන ඇත්තේ 1983ට පෙර බවයි. එම නිසා ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් ලිපිවල වැඩි පාරිතෝෂිකයක් ගෙවීම පිළිබඳව හෝ එවැනි ප්‍රතිලාභයක් ඉල්ලා නොසිටින බවට සඳහන්වීම සැලකිල්ලට නොගැනීමට තීරණය කළෙමි. එසේම සේවා පාර්ශවය ඉදිරිපත් කල අනෙක් කරුණු වන්නේ වැඩිවාසිදයක පාරිතෝෂිකයක් දෙපාර්ශවය අතර සාමුහික ගිවිසුමක් හෝ වෙනත් ලිඛිත ගිවිසුමක් නොමැතිවම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල මාස 1/2 පදනම් කරගෙන පාරිතෝෂිකය ගෙවන බව සඳහන්වීම හා මාස 1/2ක් පදනම් කරගෙන පාරිතෝෂිකය ගෙවිය යුතු බව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්මත කරය තිබීමයි. සමාගමේ මූල්‍ය වාර්තාවේ අඩංගුව ඇති ඡේද ඉල්ලුම්කරුවන්ග් මූලික සාක්ෂියේ දී ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ද තවත් මූල්‍ය වාර්තා දෙකක් ඡේද දෙවන පාර්ශවය විසින් ද ලකුණු කර අධිකරණයේ අවධානයට යොමු කරන ලදී. ඉල්ලුම්කරුවන් වෙනුවෙන් පෙන්වා දුන්නේ 2008 වසරට අදළ මූල්‍ය වාර්තාවේ 2.2.11(a) ලෙස ලකුණු කළ කොටසයි. (A14 හා A14(a)) හා වර්ෂ 10කට වඩා වැඩි කාලයක් සේවය කරන ලද සේවකයින්ට මසක වැටුප පදනම් කරගෙන පාරිතෝෂිත මුදල් ගෙවන බව එම කොටසේ සඳහන් වන බව ඉල්ලුම්කරුවන් වෙනුවෙන් පෙන්වා දෙන ලදී. දෙවන පාර්ශවය විසින් R14 ලෙස ද, 2016 වසරේ සමාගමේ මූල්‍ය වාර්තාවේ 2017 වසරේ මූල්‍ය වාර්තාවේ A15 ලෙස ද ඉදිරිපත් කරන ලද අතර R15 ලේඛණයේ පාරිතෝෂිකයේ අදළ කොටසේ සිංහල පරිවර්තනයක් R15(a) ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එහි මෙසේ සඳහන් වේ.

''ආයතනයේ පෙර ප්‍රතිපත්තිය අනුව 2005 දෙසැම්බර් 31 වැනි දින හෝ ඊට පෙර සේවයට බැඳුණු සේවකයන්ට සේවය කරන ලද එක් එක් වාර්ෂය සඳහා සේවයට බැඳුණු වර්ෂයේ සිට මසක වැටුපට හෝ වේතනයට සමාන මුදලක් පාරිතෝෂිකය වශයෙන් ලැබීමට හිමිකම් ලැබිය යුතු වේ. ''

මෙම ප්‍රතිපත්තිය 2016.09.06 දින අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකින් 2016.02.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස 1/2ක වැටුප පදනම්ව කටයුතු කිරීමට වෙනස් කර ඇත.

මූල්‍ය වාර්තාවේ සඳහන් එම කොටසින් පැහැදිලි වන්නේ සමාගම විශ්‍රාම ගන්වන සේවකයෙකුට විශ්‍රාම ගත්විට අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයන්ට පෙර මාසයක වැටුප පදනම් කරගත් පාරිතෝෂිකයක් ගෙවන ලද බවයි. එම නිසා ඉල්ලුම්කරුවන් අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනා සම්මතයට පෙර මසක වැටුප පදනම් කරගෙන සමාගම පාරිතෝෂිකය ගෙවන ලද බව අමුතුවෙන් තහවුරු කිරීම අවශ්‍ය වූයේ නැත.

දෙවන පාර්ශවය ප්‍රකාශ කරන ආකාරයට මාස 1/2ක වැටුප පදනම් කර පාරිතෝෂිකය ගණනය කරන ලද්දේ අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනා සම්මතයක් අනුවය. R16 ලෙස ලකුණු කරන ලද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව කෙරේ අවධානය යොමු කළෙමි.

2016.09.06 දින දරන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවේ 2016.01.31 තෙක් සමාගම අනුගමනය කල පාරිතෝෂිකය ප්‍රතිපත්තිය සඳහන් කර ඇත්තේ මෙසේ ය.

(a) Employees who joined on or before 31st December 2005 - Full month Basic Salary X number of years of service

(b) Employees who joined on or before 01st January 2006 - Half month's Basic Salary X number of years service

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය අනුව ඉහත පාරිතෝෂිත ප්‍රතිපත්තිය 2016.02.01 දින සිට බලපවත්වන පරිදි සියලුම සේවකයින් සඳහා මාස 1/2ක වැටුප පදනම් කරගෙන ගෙවිය යුතු බවට තීරණය කර ඇත. ඒ බව එම යෝජනාවේ සඳහන් වන්නේ මෙසේ ය.

All Employees - Half month's Basic Salary X number of years of service

මෙම යෝජනාවේ අඩංගු කරුණු වලින් පැහැදිලි වන එක් කරුණක් වන්නේ සමාගම 2005 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර සේවයට බැඳුණු සේවකයින් විශ්‍රාම යනවිට මාසික වැටුප ඔවුන් සේවය කළ වසර ගණනින් වැඩිකර පාරිතෝෂික මුදල ගෙවන ලද බවයි. තවද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය එතෙක් අනුගමනය කළ පාරිතෝෂිත ප්‍රතිපත්තිය 2016.09.06 දින සම්මත කරන ලද යෝජනාවෙන් වෙනස්කර ඇත්තේ අතීතයට ද බලපාන පරිදිය. එනම් 2016 පෙබරවාරි 01 වැනි දිනට සිට ක්‍රියාත්මක වන පරිදි ය. ඉල්ලුම්කරුවන් අතරින් තිස්ස ගුණසේන නමැති ඉල්ලුම්කරු විශ්‍රාම ගන්වා ඇත්තේ 2016 මාර්තු 08 වැනි දින දී ය A1(9) එම්. බී. කේ. රන්දෙනිය නමැති ඉල්ලුම්කරු විශ්‍රාම ගන්වා ඇත්තේ 2016 අගෝස්තු 13 වන දින දී ය. එල්. ඩබ්. අතුකෝරල යන ඉල්ලුම්කරු විශ්‍රාම ගන්වා ඇත්තේ 2016 ජුනි 29 වන දින දී ය. (A10(9). එයින් පැහැදිලි වන්නේ එම සේවකයින් විශ්‍රාම ගැන්වීමෙන් පසු අතීතයට බලපාන පරිදි අධ්‍යක්ෂක මණ්ඩලය එකී යෝජනාව සම්මත කර ඇති බවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය නිසා මෙම සේවකයින් 10 දෙනාට ලැබී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය බලපවත්වන ලද දිනට පෙර විශ්‍රාම ගිය සේවකයින්ට ලැබුණ පාරිතෝෂිත මුදලින් අඩකි. මාස 1/2ක වැටුප පදනම් කරගෙන පාරිතෝෂිකය ගෙවීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ගෙන ඇති තීරණයෙන් මෙම සේවකයන් 10 දෙනාට අසාධාරණයක් සිදුවී ඇති බවද, ඒ අනුව ඉල්ලුම්කරුවන් 10 දෙනාට ඔවුන්ගේ මාසික වැටුප සේවය කළ වසර ගණනින් වැඩිකර ලැබෙන මුදල පාරිතෝෂිකය වශයෙන් ලැබීමට අයිතිවාසිකම් ඇති බවද තීරණය කරමි.

ඉල්ලුම්කරුවන් විසින් A16 ලෙස ලකුණ කර ඉදිරිපත් කර ඇති ලේඛනයේ එක් එක් ඉල්ලුම්කරුගේ සේවා කාලය ද සමාගම විසින් ගෙවන ලද පාරිතෝෂික මුදල ද සඳහන් කර ඇත. එම මුදල ගණනය කර ඇත්තේ එක් එක් ඉල්ලුම්කරුවන්ගේ මාස 1/2 ක මාසික වැටුප පදනම් කරගෙනය. ඉල්ලුම්කරුවන්ට මාසයක වැටුප පදනම් කරගෙන පාරිතෝෂිකය ගණනය කළ යුතු බව තීරණය කර ඇති නිසා එක් එක් ඉල්ලුම්කරුවන්ට දැනට ගෙවා ඇති පාරිතෝෂික මුදලට සමාන පාරිතෝෂිත මුදලක් ද, හිඟ පාරිතෝෂික මුදල ගෙවීම නියමිත දිනට මාස 12කට වැඩි කාලයක් ප්‍රමාද වී ඇති හෙයින් එම මුදලට 30%ක අධිභාරයක් ද හිමිවිය යුතු බව තීරණය කරමි. තවද එක් එක් ඉල්ලුම්කරුට රුපියල් 10,000/- බැගින් නඩු ගාස්තු ද හිමිවිය යුතු බව තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුවන්ට පහත සඳහන් පරිදි හිඟ පාරිතෝෂික මුදල ද, අධිභාරය ද ප්‍රදානය කරමි.

| නම | ලැබිය යුතු අමතර පාරිතෝෂික මුදල | ලැබිය යුතු අධිභාර මුදල | මුළු මුදල |
|---|---|---|---|
| 01. ටී. ඩී. තිස්ස ගුණසේන මයා, | රු. 7,82,765.00 | රු. 2,34,829.50 | රු. 10,17,594.50 |
| 02. එච්. කේ. එම්. ටී. කේ. ධර්මදස මයා, | රු. 8,21,187.50 | රු. 2,46,356.25 | රු. 10,67,543.75 |
| 03. කේ. ප්‍රේමසිරි මයා, | රු. 8,79,637.50 | රු. 2,63,891.25 | රු. 11,43,528.75 |
| 04. එම්. බී. කේ. රන්දෙනිය මයා, | රු. 4,78,940.00 | රු. 1,43,682.00 | රු. 6,22,622.00 |
| 05. ආර්. එල්. පී. බී. විජයනාම මයා, | රු. 7,35,175.00 | රු. 2,20,552.50 | රු. 9,55,727.50 |
| 06. එච්. වී. හේමලතා මිය, | රු. 5,14,135.00 | රු. 1,54,240.50 | රු. 6,68,375.50 |
| 07. එම්. කේ. ජී. වසන්ත කුමාර මයා, | රු. 4,07,460.00 | රු. 1,22,238.00 | රු. 5,29,698.00 |
| 08. ටී. ජී. පී. පීරිස් මයා, | රු. 8,42,520.00 | රු. 2,52,756.00 | රු. 10,95,276.00 |
| 09. ජේ. ඩබ්. පුෂ්පකුමාර මයා, | රු. 4,21,785.00 | රු. 1,26,535.50 | රු. 5,48,320.50 |
| 10. එල්. ඩබ්. අතුකෝරල මයා, | රු. 8,57,847.50 | රු. 2,57,354.25 | රු. 11,15,201.75 |

ඉහත සඳහන් මුදල් මාස දෙකක් ඇතුළත උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු වේ. මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවද ප්‍රකාශ කරමි.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2019 ඔක්තෝබර් මස 18 වැනි දින දීය.

12 - 23

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.